සියළු ම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: නර්තනය | කාලය Time: පැය 03 |

- **අංක 01 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

## I කොටස

01. කෙනෙකුගේ බාහිර ස්වරූපය වෙනස් කර චරිතයට ගැලපෙන පරිදි සකස්කර ගැනීම …………………….. අංග රචනයයි.
    1. ශෛලිගත 2. චරිතාංග 3. විකාරරූපී 4. ස්වභාවික

02. අද්භූත රසය ජනිත වනුයේ …………………….. නැමති ස්ථායිභාවයෙනි.
    1. විශ්මය 2. භය 3. උත්සාහ 4. ශෝක

03. 10 වන ගොඩ සරඹය හඳුන්වන සරඹ නාමය වන්නේ,
    1. අංගහාරය 2. බඹර සරඹය 3. අර්ධ චක්‍රය 4. පැනීම් හරඹය

04. ''දොදොංත තකු දොං'' යන බෙර පදයට අනුව ගයන වන්නමකි.
    1. සැවුලා 2. තුරඟා 3. සිංහරාජ 4. වෛරෝඩි

05. උඩරට වන්නමකට අයත් කොටස් ගණන,
    1. 6 කි. 2. 5 කි. 3. 4 කි. 4. 3 කි.

06. දෙවන රාජසිංහ රජ සමයේදී ලංකාවට පැමිණි දේශ සංචාරක වාර්තාකරුවෙකි.
    1. පාහියන් භික්ෂුව 2. ඉබන් බතුතා
    3. රොබට් නොක්ස් 4. ස්පීල් බර්ජන්

07. ආංගික අභිනයේදී හිස, කඳ, දෑත්, දෙපා අයත් වන්නේ …………………….. වලටය.
    1. අංග 2. ප්‍රත්‍යංග 3. උපාංග 4. පංචාංග

08. ගැටබෙරය වාදනයේදී බෙරයේ දකුණු ඇස ගැටිය අසලට සුළැඟිලි ප්‍රදේශයෙන් වාදනයේදී …………………….. අක්ෂරය උපදී
    1. තත් 2. ජිත් 3. තොං 4. නං

09. සිංහල ගැමි නැටුම් වල එන කුලු නැටුමට සමාන ද්‍රවිඩ ජන නැටුම වන්නේ,
    1. කෝලාට්ටම් 2. චෙම්බු 3. කාවඩි 4. සුලකු

10. 'රුංතක ජිංතක තරිකිට කුංදත්' යන කස්තිරම නැටීම ආරම්භ කරන්නේ …………………….. ගොඩ සරඹය නැටීමෙන් පසුවයි.
    1. 5 වන 2. 6 වන 3. 7 වන 4. 8 වන

11. පැල සිටුවීම, ගස් කප්පාදු කිරීම, දළු නෙළීම ආදී කාර්යයන් සිදු කරන්නේ …………………….. දීය.

1. පතල් කර්මාන්තය 2. තේ දළු කර්මාන්තය

3. කෘෂිකර්මාන්තය 4. මැටි කර්මාන්තය

12. මාත්‍රා 2 + 2 + 4 යන තාල රූපය හඳුන්වන්නේ …………………….. යනුවෙනි.

1. දෙසුලු මහ තුන්තිත 2. දෙසුලු මැදුම් තුන්තිත

3. දෙමැදුම් මහ තුන්තිත 4. සුදු මැදුම් මහ තුන්තිත

13. එකැස් බෙරයකි.

1. උඩැක්කිය 2. තම්මැට්ටම 3. දවුල 4. රබාන

14. උඩරට බෙරයට පමණක් ආවේනික අංගයකි.

1. බෙර ඇස 2. බෙර පුහුල 3. බෙර ලනුව 4. බෙර කඳ

15. විනෝදාස්වාදය අරමුණු කොටගෙන රබාන වාදනය කරන අවස්ථාවක් වන්නේ,

1. පෙරහැර 2. අවුරුදු උත්සවය

3. පිරිත් පිංකම් 4. සූවිසි විවරණ

16. ''දුරත් බැලුම නොව ලගත් බලන අය'' යන කවිපදයේ ඊලඟ පද කොටස වන්නේ,

1. ලිඳක් තුලක ඉබි ලඩෙක් කරපු වැඩ 2. හැරත් මෙහෙම යස වැඩක් උනේ නැත

3. වටත් අයට දැනෙනටත් කියම් මම 4. හටත් එලෙස වෙයි කැටත් තබම් දඩ

- **ප්‍රශ්න අංක 17 සිට 20 දක්වා ප්‍රශ්න වලට පහත රූපසටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



A B C D

17. පංචතූර්ය වර්ගීකරණයට අනුව ආතත භාණ්ඩ වේ.

1. A හා C 2. B හා C 3. A හා B 4. C හා D

18. උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්හි භාවිත ප්‍රධාන වාද්‍ය භාණ්ඩ පිළිවෙලින්,

1. A හා D 2. D හා A 3. C හා D 4. D හා C

19. හේවිසි වාදනය සඳහා යොදා ගන්නේ මින් කුමන භාණ්ඩයන් ද ?

1. A හා C 2. C හා D 3. A හා D 4. B හා D

20. අතීතයේදී විවිධ සන්නිවේදන කාර්යයන් සඳහා භාවිත භාණ්ඩයකි.

1. A 2. B 3. C 4. D

21. උඩරට වෙස් නැට්ටුවාගේ අතෙහි මැණික් කටුව ප්‍රදේශයට පළඳින විශේෂ ආභරණයකි.

1. බන්දි වළලු 2. උරහාහු 3. කෛයිමෙත්ත 4. අවුල් හැරය

22. දළදා කරඬුව මාලිගාවට නැවත වඩම්මන විට …………………….. වාදනය කරයි.

1. මගුල් බෙර 2. අඹරා හේවිසි 3. අත්‍යාබෙර 4. ගෙවැදුම් හේවිසි

23. ගාල්ල, මාතර, බෙන්තර ආදී ප්‍රදේශ වල ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය,

| | | | |
|---|---|---|---|
| 1. | පහතරට නැටුම් | 2. | උඩරට නැටුම් |
| 3. | සබරගමු නැටුම් | 4. | භරත නැටුම් |

24. මනසින් වටහාගත් යම් යම් භාවයන් මුහුණ ප්‍රධාන කොට ගෙන පෙන්වීම ……………….. වේ.

| | | | |
|---|---|---|---|
| 1. | ආංගික අභිනය | 2. | වාචික අභිනය |
| 3. | ආහාර්ය අභිනය | 4. | සාත්වික අභිනය |

25. උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන්ට අයත් සරඹ පිළිවෙලින්,

1. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද
2. ඉලංගම් සරඹ, දොඹින පද, ගොඩ සරඹ
3. ගොඩ සරඹ, දොඹින පද, ඉලංගම් සරඹ
4. දොඹින පද, ඉලංගම් සරඹ, ගොඩ සරඹ

26. උඩරට නර්තනයෙහි ප්‍රවීන ශිල්පියෙකි,

| | | | |
|---|---|---|---|
| 1. | ගෝමිස් මහතා | 2. | පණිභාරත මහතා |
| 3. | කේ.එස්. ප්‍රනාන්දු මහතා | 4. | තිස්ස කාරියවසම් මහතා |

27. පරාක්‍රමබාහු රජතුමා නගර නිර්මාණයේදී නාට්‍යශාලා පහක් ඉදිකල බව සඳහන් වන්නේ,

1. මහා වංශයේ 2. චූල වංශයේ 3. ථූප වංශයේ 4. දීප වංශයේ

28. තින්දට බාධා කල ගෝනා මැරීමට අණ කරන ලද්දේ ……………………..

| | | | |
|---|---|---|---|
| 1. | විජය රජුය. | 2. | මලය රජුය |
| 3. | සේරමාන් රජුය | 4. | පඬුවස්දෙව් රජුය. |

29. කොහොඹා කංකාරි ශාන්ති කර්මයට අයත් නාට්‍ය පෙළපාලි අංගයකි.

1. කුවේනි අස්න 2. යක්කම් 3. ආවැන්දුම 4. හත් පදය

30. සුළු මහ දෙතිතට වාදනය කල හැකි බෙර පදයකි.

| | | | |
|---|---|---|---|
| 1. | දොං ජිංත ගත දොංත | 2. | දෝං ජිං ජිං තකට දොංතකු |
| 3. | දො දොංත තකු දොං | 4. | දොං දොං ජිං ජිං ගජිගත |

31. රාජ සභාව තුල පවන් සැලීම හෙවත් සෙමෙර සැලීම යන කාර්යය ඇසුරින් නිර්මාණය වූ ජන නැටුමකි.

1. සවරම් 2. තාලම් 3. කඩු 4. චාමර

32. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් හී ශාන්ති කර්ම වලට අයත් පොදු චාරිත්‍ර වන්නේ,

1. කප් සිටුවීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම.
2. කප් සිටුවීම, මිල්ල කැපීම, තොට පේ කිරීම.
3. කප් සිටුවීම, බිසෝකප සිටුවීම, මඩු පේ කිරීම.
4. කප් සිටුවීම, මඩු පේ කිරීම, මිල්ල කැපීම.

- **ප්‍රශ්න අංක 33 සිට 37 දක්වා දී ඇති ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| A | සොකරි | ජසයා | ගුරුහාමි | වෙදරාළ |
| B | සේරමාන් රජ | දුටුගැමුණු රජ | පඬුවස්දෙව් රජ | කුවේනිය |
| C | තම්මැට්ටම | දවුල | හොරණෑව | ගැටබෙරය |
| D | පත්තිනි දෙවි | වීරමුණ්ඩ දෙවි | දෙවොල් දෙවි | කොහොඹා දෙවි |

33. උඩරට කොහොඹා කංකාරියේ පුද ලබන දෙවිවරු වන්නේ,

1. D පේළියේ I සහ II තීරු
2. D පේළියේ III සහ IV තීරු
3. D පේළියේ II සහ IV තීරු
4. D පේළියේ I සහ IV තීරු

34. පංචතූර්ය වර්ගීකරණයට අනුව විතත හා විතතාතත වාද්‍ය භාණ්ඩ නම්,

1. C පේළියේ I සහ II තීරු
2. C පේළියේ II සහ IV තීරු
3. C පේළියේ II සහ III තීරු
4. C පේළියේ III සහ IV තීරු

35. සොකරි ජන නාටකයේදී නැව් නැගී තඹරා විට ප්‍රදේශයට ගොඩ බැස්ස අය වන්නේ,

1. A පේළියේ I සහ II තීරු
2. A පේළියේ III සහ IV තීරු
3. A පේළියේ I සහ III තීරු
4. A පේළියේ II සහ IV තීරු

36. කොහොඹා කංකාරිය පුරාවෘත්ත කතාව හා සම්බන්ධ ප්‍රධාන චරිත,

1. A පේළියේ I තීරුව
2. D පේළියේ I තීරුව
3. B පේළියේ I තීරුව
4. B පේළියේ III සහ IV තීරුව

37. මේ අතුරින් හේවිසි වාදනය සඳහා යොදා ගන්නේ,

1. C පේළියේ I, II සහ III තීරු
2. C පේළියේ II, III සහ IV තීරු
3. C පේළියේ I, III සහ IV තීරු
4. C පේළියේ I, II සහ IV තීරු

38. ගායනයට පෙර තිත වාදනය කිරීම හඳුන්වන්නේ ……………….. ලෙසිනි.

1. සමග්‍රහ
2. අවග්‍රහ
3. විෂමග්‍රහ
4. නවග්‍රහ

39. සශ්‍රීකත්වය සංකේතවත් කිරීමේ අරමුණින් කරනු ලබන ගැමි නාටකයක් ලෙස හඳුන්වන්නේ,

1. උඩරට සොකරි ය.
2. පහතරට සොකරි ය.
3. උඩරට කෝලම් ය.
4. සබරගමු කෝලම් ය.

40. ''රොබට් නොක්ස්'' ලංකාවට පැමිණියේ,

1. අනුරාධපුර යුගයේ ය.
2. පොළොන්නරු යුගයේ ය.
3. කෝට්ටේ යුගයේ ය.
4. මහනුවර යුගයේ ය.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 ක් සමග ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

1). හිස්තැන් පුරවන්න.

1. ''කුඹි කතාව'' මුද්‍රා නාට්‍යයේ රංග වින්‍යාසය ………………….. මහත්මිය විසින් සිදුකර ඇත.
2. නර්තන නිර්මාණයේදී අංග රචනය අයත් වන්නේ ………………….. අභිනයටයි.
3. තත් සහ තොං යන අක්ෂර ගැට බෙරයේ ………………….. ඇසින් වාදනය කල හැක.
4. පිරිසක් එකතු වී අවුරුදු උත්සවයේ වාදනය කරනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩයකි …………………..
5. මහනුවර යුගයේදී වන්නම් ගායනා කළේ………………….. මඩුව තුළදීය.
6. අතීතයේදී රාජ්‍ය විරෝධී ක්‍රියාවකට මුල් වූ අයෙකු වද බන්දන සඳහා ගෙන යාමේදී ………………….. බෙර වාදනය කර ඇත.
7. කොහොඹා තුන් කට්ටුව පිළිබඳ කියැවෙන්නේ………………….. ශාන්ති කර්මයේදීය.
8. දෙවොල් මඩු ශාන්ති කර්මයේදී තෙල්මෙ ඇඳුම් කට්ටලයට අමතරව ප්‍රධාන වශයෙන්………………….. ඇඳුම් කට්ටලයද භාවිතා කරයි.
9. අනුරාධපුර යුගයේදී නර්තන කුල පරම්පරාවක් පිළිබඳව කියැවෙන සෙල්ලිපි දෙකකි.

   1. ………………………… 2. …………………………

10. සබරගමු නැටුම් ප්‍රචලිත ප්‍රදේශ දෙකකි.

    1. ………………………… 2. …………………………

2). (i). තුන් තිතේ තාල ප්‍රභේද නම් කරන්න. (ල.02)

(ii). ඉන් එක් ප්‍රභේදයකට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.05)

(iii). සොබමන් දෙවිවරු සදෙනෙක් එතනට යන කවිය මහ තනි තිතට ප්‍රස්ථාර කරන්න. (ල.05)

3). මේවායින් මාතෘකා තුනක් තෝරාගෙන කෙටි විස්තරයක් ලියන්න.

(i). වාචික අභිනය (ii). උඩරට බෙරය

(iii). රබන් කවි (iv). අංග රචනය

(ල.4x3)

4). (i). සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 2 ක් ලියන්න. (ල.02)

(ii). සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශ 3 ක් හා එම භාවිතා කරන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ල.05)

(iii). මෙම නාටකයේ ඔබ කැමති චරිතයක් තෝරාගෙන එම චරිතය පිළිබඳ විමසීමක් කරන්න. (ල.05)

5). (i). දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු 2 ක් නම් කරන්න. (ල.02)

(ii). දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්ති කර්ම වල සමාන චාරිත්‍ර විධි 2 ක් ලියා ඉන් එක් ශාන්ති කර්මයකට අයත් නර්තන අංගයක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල.05)

(iii). කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව තුළින් සමාජයයට ගත හැකි ආදර්ශ මොනවාදැයි විස්තර කරන්න. (ල.05)

6). පහත දැක්වෙන පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


1


2


3


4

(i). අංක 3 හා 4 රූප සටහන් වලට අයත් මුද්‍රා නාට්‍ය නම් කරන්න. (ල.02)

(ii). කථක් නර්තනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ ඇත්තේ කුමන අංකය සහිත රූපයේද ? එය නම් කරන්න. එම සම්ප්‍රදායට අදාල ගුරු කුල නම් කරන්න. (ල.05)

(iii). කුඹී කතාව මුද්‍රා නාට්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.05)

7). නර්තනය හැදෑරීම තුළින් කායික හා මානසික ස්වස්තාව ගොඩ නැගෙන අයුරු විග්‍රහ කරන්න. (ල.12)